**මැතිවරණ කොමිෂන් සභාව**

**පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

**தேர்தல் ஆணைக்குழு**

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

# Election Commission

## Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

**<u>ආකෘතිය අංක 01</u>**

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- **290**

ආයතනයේ නම :- **මැතිවරණ කොමිෂන් සභාව**

| **කමිටුව විසින් හඳුනාගන්නා ලද අඩුපාඩු** | | **ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීමට ගන්නා ලද ක්‍රියාමාර්ග/ වත්මන් තත්ත්වය** |
|---|---|---|
| 01. | රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පළමු, දෙවන හා තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබීම. | රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයේ මුරපදය වෙනස් කර නිසි පරිදි පවත්වාගෙන යනු ලබයි. |
| 02. | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයීම. | මේ වන විට අභ්‍යන්තර විගණන විමසුම සඳහා නියමිත කාල පරිච්ඡේදය තුලදී පිළිතුරු යැවීම සිදුකරනු ලබයි. |
| 03. | භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම. | වාර්තා නියමිත දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත. |
| 04. | සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබීම. | මැතිවරණ දෙපාර්තමේන්තුව පැවති සමයේ සිට ඡන්ද විමසීම්වලට සෘජුවම වැදගත්වන ඡන්ද පත්‍රිකා වැනි ද්‍රව්‍ය ප්‍රවාහනය කරන හෙයින් රථයේ මැතිවරණ කොමිෂන් සභාව හෝ රාජ්‍ය ලාංඡනය ස්ථිරවම පින්තාරු කර නොමැත. ඒ නමුත් වාමුවාවේ ඇති ලේබලයේ රාජ්‍ය ලාංඡනය සහ මැතිවරණ කොමිෂන් සභාව ලෙස සටහන් කර ඇත. |
| 05. | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර නොතිබීම. | දැනට විනය පරීක්ෂණ කටයුතු කෙරීගෙන යන නිලධාරියකුගේ නිරවුල් නොවූ ණය ශේෂයන් පමණක් පවතින අතර එම නිලධාරියා මාසිකව වාරික මුදල් නිරවුල් කරමින් පවතී. අදාල පරීක්ෂණ කටයුතු නිමවූ වහාම ඉතිරි හිඟ ණය ශේෂය අයිතිකර ගැනීමට කටයුතු කළ හැක. ඒ හැර අනෙකුත් හිඟහිටි ණය ශේෂ දැනටම නිරවුල් කර අවසන්ව ඇත. |
| 06. | ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබීම. | අදාළ පරිදි තිරසර අරමුණු හඳුනාගෙන ක්‍රියාවට නංවා ඇත. |
| 07. | හඳුනාගත් තිරසර අරමුණු ඉටුකර ගැනීම සඳහා ළඟාකර ගතයුතු ඉලක්ක තීරණය කර නොතිබීම. | මේ වනවිට තිරසර අරමුණු ඉටුකර ගැනීම සඳහා ලගා කර ගතයුතු ඉලක්ක හඳුනාගෙන ඇත. |
| 08. | හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබීම. | අදාළ පරිදි ප්‍රගතිය මැන බැලීමට දර්ශක නියම කර ඇත. |
| 09. | සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතීම. | මේ වන විට අදාළ තත්ත්වය යථාවත් කර ඇත. |
| 10. | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර | ස්ථාවර වත්කම්හි ආරම්භක ශේෂයන්හි පැවති වෙනස්කම් හා නිසි පරිදි ගිණුම්ගත නොවූ ඇතැම් |

| | | |
|---|---|---|
| | මට්ටමේ පැවතීම. | ස්ථාවර වත්කම් හේතුවෙන් අහිතකර හෝ ව්‍යාචන මට්ටමේ විගණන මතයන් පැවතුනත් දැනට එම වැරදි නිවැරදි කර හොඳ මට්ටමක විගණන මතයක් ලබා ගැනීමට කටයුතු කර ඇත. |
| 11. | 2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටුකළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03ක් හඳුනාගෙන නොතිබීම. | මේ වන විට අදාල කාර්ය කාර්යසාධක දර්ශක හඳුනාගෙන ක්‍රියාවට නංවා ඇත. |
| 12. | විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබීම. | විගණකාධිපතිවරයා විසින් පෙන්වා දෙනු ලබන අඩුපාඩු/ දෝෂ නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් හා ක්‍රියාමාර්ග සියලුම නිලධාරින් වෙත ලබාදී ඇත. |

**ප්‍රධාන ගණන්දීමේ නිලධාරි**

නම:- **සමන් ශ්‍රී රත්නායක**
තනතුරු:- **මැතිවරණ කොමසාරිස් ජනරාල්**
දිනය:- 2024.03.12